# අමුතු පැළය
# සහ
# නුවණැති පිංචා



නෙතුම්ලි සුහන්සා රත්නායක

# අමුතු පැළය
# සහ
# නුවණැති පිංචා

නෙතුම්ලී සුහන්සා රත්නායක

# අමුතු පැළය
# සහ
# නුවණැති පිංචා

© නෙතුම්ලී සුහන්සා රත්නායක

ISBN : 978-624-206-604-2

නෙතුම්ලී සුහන්සා රත්නායක
නො. 57/B, වැගොල්ල පාර, ලේවැල්ල, මහනුවර
081-2205570 | 077-7665690
E-mail :- nethumleerathnayake@yahoo.com

කර්තෘගේ වෙනත් පොත්
My First Story Book - 2019
My Second Story Book - 2020
My First Adventure & three other stores - 2021

2023.11.15

# පිදුම

“මෙම පොත

මාගේ දයාබර අම්මාට සහ අප්පච්චිට

ආදරයෙන් පුද කරමි”

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල් පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර 2023 10 20

එකමත් එක රටක කැලෑවක කූඹි ගුලක් තිබුණා. ඒ ගුලේ කූඹි රැජින අනිත් කූඹීන් සමඟ සතුටින් ජීවත් වුණා.



ඒ කූඹි ගුලේ කූඹියෝ හැම විටම කඩිසරව වැඩ කළා. කූඹි රැජින ගුල පාලනය කළා. බිත්තර දමා පැටවුන් ඇතිකළා. සමහර කූඹියෝ පැටවුන් බලාගත්තා. තවත් සමහරු ආහාර එකතු කරගන්න ගුලෙන් එළියට ගියා.






එක දවසක් කෑම සොයාගෙන ගුලෙන් එළියට ගිය කූඹියෝ කීප දෙනෙක් ආපහු ගුලට ආවේ නැහැ. කූඹි ගුලේ හැමෝම කලබල වුණා.




ගුලේ හිටපු අනිත් කූඹියෝ නැති වුණු යහළුවන්ව සොයන්න ගියා. ගස් උඩ, ගල් අතර, විල ළඟ සහ හැමතැනම බැලුවා. කණාමැදිරි යහළුවෝ එළිය ලබා දෙමින් කූඹියන්ට උදවු කළා. ඒත් නැතිවුණු කූඹි යහළුවෝ හමුවුණේ නැහැ.





ටික දිනක් ගත වුණා. හැමදාම කෑම සොයන්නට යන කූඹියෝ කිහිප දෙනෙක් අතුරුදහන් වුණා. ගුලේ හැමෝම ඒ පිළිබඳ කතා වුණා. හැමෝටම මේක ලොකු ප්‍රහේළිකාවක්.

ඒ කූඹි ගුලේ පිංචා නම් නුවණැති කූඹියෙක් සිටියා. එයා අතුරුදහන් වුණු යහළුවන් සොයන්න තීරණය කළා. කූඹි ගුල අවට ඇති දේ පිළිබඳ දැක්වෙන සිතියම හොඳින් පරීක්ෂා කළා. වටපිටාව ගැන හොඳ අවබෝධයක් ගත්තා.




ඊළඟ දිනයේ නුවණැති පිංචා කෑම සොයාගෙන යන කූඹියන් පිටුපස ගමන් කළා. කූඹි යහළුවන් කිහිප දෙනෙක් අමුතු පෙනුමක් තියෙන පැළයක් අසලට යනවා පිංචා දැක්කා.




ඒ අමුතු පැළයේ ගොටුවක් වගේ දෙයක් තිබුණා. ඒ ගොටුව ඇතුළට යන කූඹියෝ ආපහු එළියට ආවේ නැහැ. පිංචා තව ටිකක් කිට්ටු කරලා බැලුවා.



පිංචා ගොටුව අසලට යනකොට ම මැසි යහළුවෙක් පියාඹාගෙන ඇවිත් ගොටුවේ අයිනක වැහුවා. ටික වේලාවකින් මැසි යහළුවත් ගොටුව ඇතුළට වැටුණා.



සිදුවෙන දේ පිංචාට අදහගන්නවත් බැහැ. පිංචා හෙමින් හෙමින් පරිස්සමට ගොටුව උඩට නැග්ගා. එතැන හොඳටම ලිස්සනවා. ගොටුව ඇතුළට වැටුණොත් ආපහු එළියට එන්න බැරි බව පිංචා තේරුම් ගත්තා.



කැලෑවේ තිබෙන අමුතු පැළය උගුලක් බව නුවණැති පිංචා දැනගත්තා. ඉක්මනින් බිමට බැස කූඹි යහළුවන්ට ඒ පිළිබඳ දැන්වූවා.



ඉන් පසුව නුවණැති පිංචා කෘමි යහළුවන්ට සහ අනෙක් කුඩා සතුන්ටත් ඒ පැළය ගැන තොරතුරු කිව්වා. අමුතු පැළයේ උගුලෙන් ආරක්ෂා වෙන ලෙස දැන්වූවා.




එදා සිට කිසිම කූඹි යහළුවෙක් ඒ පැළය ළඟටවත් ගියේ නැහැ. කෘමි යහළුවෝ සහ අනෙක් සත්තු බොහෝම පරිස්සම් වුණා. පිංචා එයාගේ යහළුවන් සමඟ එකතු වෙලා ඒ පැළය වටේට වැටක් හැදුවා.



පිංචාගේ නුවණැති බව සහ විමසිලිමත් බව නිසා සියලු දෙනාම ආරක්ෂා වුණා. කූඹියෝ කෑම සොයාගෙන වෙන තැන්වලට ගියා. නැවත කූඹි ගුලේ කිසිවෙකු අතුරුදහන් වුණේ නැහැ.



පිංචා කළ වීර ක්‍රියාවට කූඹි රැජින පිංචාට වීර පදක්කමක් දුන්නා. හැමෝම එයාට ප්‍රශංසා කළා. පිංචාට හරිම සතුටුයි. ඉන්පසු කැලෑවේ හැමෝම සතුටින් කල් ගත කළා.



හැබැයි තවමත් ඒ කැලෑවේ කිසි කෙනෙක් දන්නේ නැහැ ඒ අමුතු පැළය බාඳුරා පැළයක් කියලා.





# පසුවදන

නූතන ක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයක් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරයන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවා'යි පතමු.

මෙයට,
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20